# (ආ) කාර්මික නිෂ්පාදනය

## (අ) හැඳින්වීම

කාර්මික නිෂ්පාදනය පිලිබඳ වත්මන් සමීක්ෂණයට 1970 ලිත් වර්ෂය තුළවූ රාජ්‍ය සහ පෞද්ගලික අංශද්වයේම නිෂ්පාදන ක්‍රියාවලිය අයත්වේ. විවිධ කාර්මික ඒකකයන් වෙත තැපැල් කරන ලද ප්‍රශ්නාවලියක් මගින්ද, අවශ්‍ය තැනදී පෞද්ගලිකව හමුවීමෙන්ද, නිෂ්පාදනය, සේවා නියුක්තිය, වැටුප්, ශ්‍රමික පැය, ඉන්ධන හා බල උත්පාදන වියදම් සහ අමු ද්‍රව්‍යයන්හි අගය පිළිබඳ දත්තයන් සපයා ගත් අතර, මීට අමතරව කර්මාන්ත සහ විද්‍යා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයෙන්ද තොරතුරු ලබාගන්නා ලදී.

කාර්මික ක්‍රියාවලිය පිළිබඳ මෙම විශ්ලේෂණයේ අරමුණ වන්නේ කාර්මික සංවර්ධනයේ ප්‍රධාන උපනතීන් අගැයුමට ලක් කිරීමත් කාර්මික අංශයේ විවිධ ශාඛාවන්හි ක්‍රියාකාරිත්වය හා සම්බන්ධ වඩා වැදගත් අංගයන් හුවා දැක්වීමත්ය.

පිළිතුරු සැපයූ කාර්මික ඒකකයන් 1853 ක වාර්තා අනුව 1970 කාර්මික නිෂ්පාදන වටිනාකම රුපියල් දශලක්ෂ 1945·0 ක් විය. මෙයට 1969 අවසානයේදී වාණිජ නිෂ්පාදනය ඇරඹූ තෙල් පිරිපහදු කම්හලේ නිෂ්පාදනයද පළමු වරට ඇතුළත්වේ. 1969 සහ 1970 නිෂ්පාදන දත්තයන් සසඳනු වස් තෙල් පිරිපහදු කම්හලේ රුපියල් දශලක්ෂ 181 ක් වූ නිෂ්පාදන ඇතුළත් නොකරන්නේ නම්, පසුගිය වර්ෂයට වඩා 1970 කාර්මික නිෂ්පාදන මුළු වටිනාකමේ නියම වැඩිවීම සියයට 8·4 ක් වේ. 1969 වැඩිමාවවූ සියයට 16·2 හා සසඳන විට මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ පූණි ධාරිතාවෙන් ක්‍රියාකාරිවූ රාජ්‍ය සංස්ථා කිපයක් විසින් වාර්තා කරන ලද නිෂ්පාදනයෙහි සැලකිය යුතු වර්ධනයයි. රාජ්‍ය සහ පෞද්ගලික අංශයන්හි නිෂ්පාදන ප්‍රමාණයන් 1970 කාර්මික නිෂ්පාදන මුළු වටිනාකමින් පිළිවෙලින් සියයට 31 සහ සියයට 69 ක් වේ. කාර්මික නිෂ්පාදනයේ මුළු වටිනාකමින් සියයට 58 ක් පමණ ආහාර පාන හා දුම්කොළ සහ රසායනික ද්‍රව්‍ය, ඛණිජ තෙල්, ගල් අඟුරු, රබර් හා ප්ලාස්ටික් නිෂ්පාදිත යන ප්‍රධාන කර්මාන්ත ගනයන් වෙතින් සැපයුන අතර මෙම සමීක්ෂණයට යොමුවූ සේවක සමුදයෙන් සියයට 45 ක් පමණ මෙම ගනවලට අයත් කර්මාන්තයන්හි නියැලී සිටියි.

## (ආ) ප්‍රධාන උපනතීන්

### කර්මාන්ත ප්‍රතිපත්තිය

රජයේ සමාජ හා දේශපාලන අරමුණුවලට අනුකූල වනසේ, දැනට ලංකාවේ පවත්නා කාර්මික ව්‍යුහය ප්‍රතිසංවිධානය කිරීම් වස් රජය විසින් ගෙන ඇති ප්‍රධාන ප්‍රතිපත්ති තීරණ 1970 දී ප්‍රකාශයට පත්කරනු ලැබීය. ඒ අතරින් පහත සඳහන් දෑ වැදගත් වනු ඇත.

(අ) දේශීය අමු ද්‍රව්‍ය වැඩි වශයෙන් පාවිච්චියට ගැනෙන කර්මාන්තයන් දිරිගැන්වීම හා නගා සිටුවීම.

(ආ) දේශීය කර්මාන්ත කරුවන් වෙත බෙදා හැරිම සඳහා කාර්මික අමු ද්‍රව්‍ය හැකි සෑම විටම තොග වශයෙන් රජය විසින් ආනයන කිරීමේ හැකියාවන් පිරික්සීම

(ඇ) නිෂ්පාදිත භාණ්ඩවල තත්ත්වය හා මිල පාලනය කිරීම.

අළුත් කර්මාන්තවලට අනුමැතිය දීමේදී භාණ්ඩ සෑදීමට උපයෝගී කරගන්නා අමු ද්‍රව්‍ය සහමුලින්ම දේශීය වන, නොඑසේ නම් වැඩි කොටසක් දේශීය වන, කර්මාන්ත කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ඇත. මෙම පිළිවෙත ක්‍රියාවේ යෙදූ කල, අමු ද්‍රව්‍ය යොදගැන්මේ රටාවෙහි වෙනසක් සිදුවන අතර ආනයනය කරනු ලබන අමු ද්‍රව්‍ය වෙනුවෙන් වැයවන විදේශීය විනිමය ප්‍රමාණයෙහිද සැලකිය යුතු ඉතිරිවීමක් සිදුවනු ඇත.

කාර්මික අමු ද්‍රව්‍ය වැඩි වශයෙන් රජය මගින් ආනයනය කිරීමේදී, තොග වශයෙන් මිලට ගැනීම හේතුකොටගෙන ඒ සඳහා ගෙවිය යුතු මිල අඩුවන අතර, එයින් අමු ද්‍රව්‍ය ආනයන වෙනුවෙන් කැප කිරීමට සිදුවන විදේශ විනිමය ප්‍රමාණයද අඩුවනු ඇත. විදේශ විනිමය අක්‍රමිකතාද එමගින් මැඩලෙන අතර, අමු ද්‍රව්‍ය ආනයනයේදී අධිප්‍රමානික මිල ගණන් දැක්වීමෙන් රටට අහිමිවී යන විදේශ විනිමයද රැකෙනු ඇත.

රජය මගින් පාලනය වන අමු ද්‍රව්‍ය ආනයනයක් තුළින් කර්මාන්ත වල අවශ්‍යතාවයන් කාර්යක්ෂමව සැපයීමේ ක්‍රමයක් ඇති කළ හැකි වන්නේ නම් භාණ්ඩයන්හි තත්ත්වයන්ද ප්‍රමිතකරණයකට පත්වන අතර පාරිභෝගිකයන්ට වාසි සැලසෙන පරිදි නිෂ්පාදන වියදම් පහත් මට්ටමකට හෙළිය හැකිවනු ඇත.

**කර්මාන්තයන්හි පිහිටීම**

කර්මාන්ත ආයතන බස්නාහිර පළාතේ, විශේෂයෙන්ම කොළඹ හා ඒ අවට, රාශිභූතවී ඇති අයුරු II (ආ) 8 සංඛ්‍යා සටහනින් පෙන්නුම් කෙරෙයි. කර්මාන්ත ආයතන වලින් සියයට 81 ක් පමණ බස්නාහිර පළාතේ පිහිටා තිබෙන අතර, අනෙක් ආයතන ඉතිරි පළාත් අටෙහි විසිරී ඇත. මීළඟ තැන් ගන්නා විශාලම ඒකාග්‍රියතාවය පිළිතුරු සැපයූ ආයතනවලින් සියයට 5·2 ක් පිහිටි දකුණු පළාතේ වන අතර, අඩුම රාශිභූතවීම වූ සියයට 0·1 උතුරු මැද පළාතට අයත්වේ.

ස්ථාන නිරූපිත වියදම අධික නොවන්නේ නම්, ඌනසංවර්ධිත නැතහොත් කර්මාන්ත නොමැති පෙදෙස්හි ආරම්භ කරනු ලබන කර්මාන්තයන්ට විශේෂ සැළකිල්ලක් දක්වන බැව් මෑතදී නිකුත්කරන ලද රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයෙහි සඳහන්වේ. මෙම ප්‍රකාශනය කර්මාන්ත පිහිටා නොමැති පළාත්වල ආයෝජන කටයුතු සඳහා රුකුලක් විය හැක. එසේ වුවද ඊට අවශ්‍ය වන මූලික සැකැස්ම රජය විසින් නාගරික නොවන පෙදෙස්හි ඇතිකළ යුතුය. රට තුළ විදුලි බලය සැපයීම පුළුල් කිරීම සහ මංමාවත් සංවර්ධනය කිරීම පිළිබඳ රජයේ ප්‍රතිපත්තිය, මෙරට තුළ කර්මාන්ත පතුරුවා හැරීමට රුකුලක් වනු ඇත. නාගරික නොවන පෙදෙස්වල කර්මාන්ත ඇති කිරීමෙන් එම පළාත්වල පවතින සේවා වියුක්තිය සහ ඌන සේවා නියුක්තිය පිළිබඳ ප්‍රශ්නද විසඳෙන අතර, බස්නාහිර පළාතේ නාගරික ප්‍රදේශයන්හි පවතින නිවාස තදබදයද තරමක් දුරට මගහැරෙනු ඇත.

**නිෂ්පාදනය**

II (ආ) 1 සංඛ්‍යා සටහනෙහි සඳහන්වී ඇති 1970 සියළුම ප්‍රධාන කර්මාන්ත ගනයන්හි නිමැවුම් වටිනාකමේ වැඩිවීම අනුව රසායන ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදනයන්හි ඉහළම වැඩිමාවක් පෙන්නුම් කෙරෙන අතර අඩුම වැඩිමාවක් පෙන්නුම් කෙරෙනුයේ කඩදසි සහ කඩදසි නිෂ්පාදන ගනය තුළය. මුළු නිමැවුම් වටිනාකමෙහිවූ වැඩිවීම රුපියල් දශලක්ෂ 318 ක්වූ අතර, එම වැඩිවීමට ප්‍රධාන වශයෙන් දයකවූ කර්මාන්ත ගණයන් වනුයේ රසායනික ද්‍රව්‍ය, ඛණිජ තෙල්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන (සියයට 60), ආහාරපාන සහ දුම්කොළ (සියයට 14), සැකසූ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණයන්ය (සියයට 9).

II (ආ) 2 දරන සංඛ්‍යා සටහනෙහි දැක්වෙන කර්මාන්ත කාණ්ඩයන්හි නිෂ්පාදන කටයුතු විශ්ලේෂණය කිරීමේදී වැදගත් අංගයන් කිහිපයක් හෙළිවේ. ආහාර නිෂ්පාදිත කාණ්ඩයේ නිමැවුම් වටිනාකමෙහි වැඩිවීමට මුළුමනින්ම පාහේ හේතුවී ඇත්තේ එක් රාජ්‍ය සංස්ථාවක නිමැවුම 1970 දී ඉකුත් වර්ෂයේ නිමැවුම මෙන් දෙගුණයක් පමණ වීමය. කල් තැබිය හැකි හා ටින්වල අසුරන ලද පලතුරු, එළවළු, මස්, මාළු සහ වෙනත් මුහුදු ආහාර කර්මාන්ත කාණ්ඩයෙහි නියැලුන නිෂ්පාදන ආයතන සංඛ්‍යාව අඩුවී

## 1967-70 කාර්මික නිෂ්පාදනය හා

| කාර්මික ගණය | සමාගම් ගණන | | | | සේවක සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 1967 | 1968 | 1969 | 1970 | 1967 | 1968 | 1969 | 1970 |
| I. ආහාර, පානවර්ග සහ දුම්කොළ නිෂ්පාදනය .. .. | 822 | 588* | 654 | 649 | 26401 | 24878 | 31889 | 33734 |
| II. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම්භාණ්ඩ කර්මාන්ත .. .. | 393 | 496 | 537 | 530 | 20052 | 35528 | 25469 | 27069 |
| III. දැව සහ දැව භාණ්ඩ (ගෘහ භාණ්ඩ ඇතුළුව) .. .. | 14 | 20 | 15 | 11 | 2453 | 2575 | 3393 | 2907 |
| IV. කඩදාසි සහ කඩදාසි භාණ්ඩ නිෂ්පාදනය .. .. | 78 | 90 | 95 | 74 | 2660 | 4146 | 4876 | 4462 |
| V. රසායන ද්‍රව්‍ය, පෙට්‍රෝලියම්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදනයන් .. | 246 | 284 | 276 | 244 | 8117 | 11213 | 12414 | 13610 |
| VI. ලෝහ නොවන ඛණිජ නිෂ්පාදනයන් (පෙට්‍රෝලියම් සහ ගල් අඟුරු හැර) .. | 61 | 53 | 75 | 67 | 6118 | 6084 | 7811 | 8545 |
| VII. මූලික ලෝහ නිෂ්පාදිතයන් .. .. | — | 1 | 1 | 1 | — | 950 | 960 | 963 |
| VIII. සකස් කළ ලෝහ භාණ්ඩ යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ නිෂ්පාදනය .. .. | 183 | 253 | 282 | 228 | 7648 | 15529 | 16119 | 12448 |
| IX. නිෂ්පාදිත භාණ්ඩ (අන් තැනක නොසඳහන්) .. | 33 | 19 | 27 | 49 | 506 | 445 | 795 | 1367 |
| එකතුව | 1830 | 1804 | 1962 | 1853 | 73955 | 101348 | 103726 | 105105 |

* ආයතන 365 ක් සඳහා වැටුප් බීල

II (ආ) 1 සංඛ්‍යා සටහන

# සේවා නියුක්ති සංඛ්‍යාමය විස්තර සම්පිණ්ඩනය

| ශ්‍රමික දින එකතුව (දහස් ගණනින්) | | | | වැටුප් බිල (රුපි. දශ ලක්ෂ) | | | | නිෂ්පාදන වටිනාකම (රුපි. දශ ලක්ෂ) | | | | ශ්‍රමික දින වැටුප් (රුපියල්) | | | | සේවකයෙකුට වෙන්වන ශ්‍රමික දින | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1967 | 1968 | 1969 | 1970 | 1967 | 1968 | 1969 | 1970 | 1967 | 1968 | 1969 | 1970 | 1967 | 1968 | 1969 | 1970 | 1967 | 1968 | 1969 | 1970 |
| 7251 | 7122 | 8982 | 9651 | 52·0 | 46·8 | 58·3 | 64·4 | 422·3 | 609·6 | 641·8 | 684·5 | 7·17 | 6·57 | 6·49 | 6·67 | 275 | 286 | 282 | 286 |
| 5324 | 9301 | 6433 | 7352 | 25·8 | 46·0 | 31·8 | 46·0 | 177·1 | 224·3 | 267·1 | 282·7 | 4·85 | 4·95 | 4·94 | 6·25 | 266 | 262 | 253 | 272 |
| 458 | 752 | 949 | 738 | 3·1 | 6·6 | 7·0 | 8·8 | 10·4 | 16·9 | 18·0 | 21·2 | 6·77 | 8·78 | 7·38 | 11·89 | 187 | 292 | 280 | 254 |
| 673 | 1187 | 1412 | 1195 | 5·2 | 8·9 | 10·8 | 10·7 | 34·7 | 54·6 | 62·3 | 65·0 | 7·73 | 7·50 | 7·65 | 8·92 | 253 | 286 | 290 | 268 |
| 1916 | 3124 | 3459 | 3782 | 15·9 | 30·8 | 34·1 | 39·1 | 136·7 | 203·3 | 249·8 | 439·2 | 8·30 | 9·86 | 9·86 | 10·33 | 236 | 279 | 279 | 278 |
| 1581 | 1670 | 2131 | 2287 | 11·2 | 17·1 | 18·6 | 26·1 | 69·5 | 92·8 | 123·3 | 138·8 | 7·08 | 10·24 | 8·73 | 11·42 | 258 | 275 | 273 | 268 |
| — | 260 | 288 | 270 | — | 3·4 | 4·0 | 2·8 | — | 27·3 | 28·8 | 38·9 | — | 13·08 | 13·89 | 10·55 | — | 274 | 300 | 280 |
| 1970 | 3932 | 4501 | 3320 | 14·1 | 28·2 | 33·7 | 29·4 | 102·0 | 167·1 | 226·2 | 256·1 | 7·16 | 7·17 | 7·49 | 8·87 | 258 | 253 | 279 | 267 |
| 144 | 114 | 212 | 395 | 0·7 | 0·6 | 1·2 | 2·1 | 1·5 | 2·7 | 9·5 | 18·6 | 4·93 | 5·26 | 5·66 | 5·40 | 281 | 256 | 267 | 289 |
| 19315 | 27462 | 28367 | 28990 | 128·0 | 188·4 | 199·5 | 229·4 | 954·2 | 1398·6 | 1626·8 | 1945·0 | 6·62 | 6·86 | 7·03 | 7·91 | 261 | 271 | 273 | 276 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## 1966/70 කාර්මික නිෂ්පාදනයේ වටිනාකම කර්මාන්ත වල

| කාර්මික ගණය | නිෂ්පාදන වටිනාකම (රුපියල් දශ ලක්ෂ) | | | | |
|---|---|---|---|---|---|
| | 1966 | 1967 | 1968 | 1969 | 1970 |
| 1· ආහාර පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදනය .. | **389·9** | **422·3** | **609·6** | **641·8** | **684·5** |
| (අ) සැකසූ ආහාර .. .. .. | 134·5 | 130·6 | 250·0 | 230·5 | 250·6 |
| (ආ) එළවළු තෙල් වර්ග සහ මේද .. .. | 142 3 | 139·7 | 162·0 | 169·5 | 170·1 |
| (ඇ) කල්තබාගත හැකි සහ ටින්වල අසුරන ලද පළතුරු, එළවළු, මස් මාළු සහ අනෙකුත් මුහුදු ආහාර .. | 5·1 | 6·7 | 8·4 | 8·6 | 11·8 |
| (ඇ) බිස්කෝතු, කොකෝවා, චොකලට් සහ සීනි රසකැවිලි | 38·6 | 33·3 | 44·3 | 49·9 | 50·5 |
| (ඉ) පාන වර්ග සහ ස්ප්‍රීතු .. .. .. | 17·1 | 20·0 | 34·4 | 77·4 | 94·9 |
| (ඊ) දුම්කොළ .. .. .. | 52·3 | 92·0 | 110·5 | 105·9 | 106·6 |
| 2· රෙදිපිලි, ඇඳුම් පැළඳුම් සහ සම්භාණ්ඩ කර්මාන්ත .. | **178·9** | **177·1** | **224·3** | **267·1** | **282·7** |
| (අ) ගොතන ලද ඇඳුම් පැළඳුම් සහ මැසූ ඇඳුම් හා අනෙකුත් ආයිත්තම් (පාවහන් හැර) .. .. | 56·1 | 48·1 | 55·7 | 56·0 | 64·3 |
| (ආ) නූල් කැටීම, රෙදිපිළි විවීම සහ නිම කිරීම .. | 95·1 | 97·1 | 136·2 | 172·2 | 173·3 |
| (ඇ) පාවහන් සහ සම් නිෂ්පාදිතයන් .. .. | 27·7 | 31·9 | 32·4 | 38·9 | 45·1 |
| 3· දැව සහ දැව භාණ්ඩ නිෂ්පාදනය (ගෘහ භාණ්ඩ ඇතුළුව) .. | **6·5** | **10 4** | **16·9** | **18·0** | **21·2** |
| (අ) දැව නිෂ්පාදිත .. .. .. | – | 3·6 | 8·0 | 9·2 | 10·4 |
| (ආ) තුනී ලෑලි .. .. .. | 6·5 | 6·8 | 8·9 | 8·8 | 10·8 |
| 4· කඩදසි සහ කඩදාසි භාණ්ඩ .. .. .. | **33·8** | **34·7** | **54·6** | **62·3** | **65·0** |
| 5· රසායනික, පෙට්‍රෝලියම්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය .. .. .. | **137·2** | **136·7** | **203·3** | **249·8** | **439·2** |
| (අ) කාර්මික රසායන ද්‍රව්‍ය .. .. .. | 1·9 | 1·9 | 2·3 | 2·2 | 3·1 |
| (ආ) විවිධ රසායනික නිෂ්පාදිතයන් .. .. | 101·9 | 98·2 | 118·9 | 155·6 | 155·9 |
| (ඇ) පෙට්‍රෝලියම් සහ ගල්අඟුරු නිෂ්පාදිතයන් .. | – | – | 8·3 | 11·0 | 191·0 |
| (ඇ) රබර් නිෂ්පාදිතයන් .. .. .. | 18·9 | 20·7 | 41·3 | 52·8 | 56·4 |
| (ඉ) ප්ලාස්ටික් නිෂ්පාදිතයන් .. .. .. | 14·5 | 15·9 | 32·5 | 28·2 | 32·8 |
| 6· ලෝහ නොවන ඛනිජ භාණ්ඩ නිෂ්පාදනය (පෙට්‍රෝලියම් සහ ගල් අඟුරු හැර) .. .. | **32·5** | **69·5** | **92·8** | **123·3** | **138·8** |
| (අ) පිහන් බඩු .. .. .. | 2·3 | 4·4 | 8·5 | 8·7 | 8·0 |
| (ආ) වීදුරු සහ වීදුරු නිෂ්පාදිතයන් .. .. | – | – | 4·8 | 7·7 | 8·1 |
| (ඇ) සිමෙන්ති, සිමෙන්ති නිෂ්පාදිතයන් සහ ඇස්බැස්ටෝස් නිෂ්පාදිතයන් .. .. | 28·8 | 53·5 | 70·0 | 89·0 | 104·8 |
| (ඇ) ඉල්මනයිට් නිෂ්පාදනය .. .. .. | 1·4 | 1·4 | 2·2 | 3·1 | 4·7 |
| (ඉ) ගඩොල් සහ උළු .. .. .. | – | 10·2* | 7·3 | 14·8 | 13·2 |
| 7· මූලික ලෝහ භාණ්ඩ .. .. .. | – | – | **27·3** | **28·8** | **38·9** |
| (අ) යකඩ සහ වානේ මූලික කර්මාන්ත .. .. | – | – | 27·3 | 28·8 | 38·9 |
| 8· සකස්කරන ලද ලෝහභාණ්ඩ සහ යන්ත්‍රෝපකරණ නිෂ්පාදනය | **69·8** | **102·0** | **167·1** | **226·2** | **256·1** |
| (අ) සකස් කරන ලද ලෝහ භාණ්ඩ (යන්ත්‍රෝපකරණ හැර) | 49·0 | 54·1 | 79·4 | 82·0 | 96·9 |
| (ආ) යන්ත්‍ර සූත්‍ර (විදුලි නොවන යන්ත්‍රසූත්‍ර) සහ ප්‍රවාහන උපකරණ .. .. .. | – | 19·8 | 45 9 | 77·9 | 70·8 |
| (ඇ) විදුලි යන්ත්‍ර සූත්‍ර, මෙවලම් උපකරණ හා සැපයුම් .. | 20·8 | 28·1 | 41·8 | 66·3 | 88·4 |
| 9· නිෂ්පාදිත භාණ්ඩ (අන් තැනක සඳහන් නොවූ) .. | **1·7** | **1·5** | **2·7** | **9·5** | **18·6** |
| එකතුව .. .. .. | 850·3 | 954·2 | 1,398·6 | 1,626.8 | 1945·0 |

* වීදුරු සහ වීදුරු භාණ්ඩ ඇතුලත් වේ.

II (ආ) 2 සංඛ්‍යා සටහන

ස්වරූපය හා ප්‍රධාන නිෂ්පාදන අනුව වර්ග කොට

| කර්මාන්තයෙහි සියයට ගණන | | | | | මුළු කාර්මික නිෂ්පාදනයේ සියයට ගණන | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1966 | 1967 | 1968 | 1969 | 1970 | 1966 | 1967 | 1968 | 1969 | 1970 |
| 100·0 | 100·0 | 100 0 | 100·0 | 100·0 | 45·9 | 44·3 | 43·6 | 39·5 | 35·2 |
| 34·5 | 30·9 | 41·0 | 35·9 | 36·6 | 15·8 | 13·3 | 17·8 | 14·2 | 12·9 |
| 36·5 | 33·1 | 26·6 | 26·4 | 24·9 | 16·7 | 13·0 | 11·6 | 10·4 | 8·7 |
| 1·3 | 1·6 | 1·4 | 1·3 | 1·7 | 0·6 | 0·7 | 0·6 | 0·5 | 0·6 |
| 9·9 | 7·9 | 7·3 | 7·8 | 7·4 | 4·5 | 3·5 | 3·2 | 3·1 | 2·6 |
| 4·4 | 4·7 | 5·6 | 12·1 | 13·9 | 2·0 | 2·8 | 2·4 | 4·8 | 4·9 |
| 13·4 | 21·8 | 18·1 | 16·5 | 15·6 | 6·2 | 8·9 | 7·9 | 6·5 | 5·5 |
| 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 21·0 | 18·6 | 16·0 | 16·4 | 14·5 |
| 31·4 | 27·2 | 24·8 | 21·0 | 22·7 | 6·6 | 5·0 | 4·0 | 3·4 | 3·3 |
| 53·1 | 54·8 | 60·7 | 64·5 | 61·3 | 11·2 | 10·2 | 9·7 | 10·6 | 8·9 |
| 15·5 | 18·0 | 14·5 | 14·5 | 16·0 | 3·2 | 3·4 | 2·3 | 2·4 | 2·3 |
| 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 0·8 | 1·1 | 1·2 | 1·1 | 1·1 |
| – | 34·6 | 47·3 | 51·1 | 49·1 | – | 0·4 | 0·6 | 0·6 | 0·5 |
| 100·0 | 65·4 | 52·7 | 48·9 | 50·9 | 0·8 | 0·7 | 0·6 | 0·5 | 0·6 |
| 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 4·0 | 3·6 | 3·9 | 3·8 | 3·3 |
| 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 16·1 | 14·3 | 14·5 | 15·3 | 22·6 |
| 1·4 | 1·4 | 1·1 | 0·9 | 0·7 | 0.2 | 0·2 | 0·2 | 0·1 | 0·2 |
| 74·3 | 71·8 | 58·5 | 62·3 | 35·5 | 12·0 | 10·3 | 8·5 | 9·6 | 8·0 |
| – | – | 4·1 | 4·4 | 43·5 | – | – | 0·6 | 0·7 | 9·8 |
| 13·8 | 15·2 | 20·3 | 21·1 | 12·8 | 2·2 | 2·2 | 3·0 | 3·2 | 2·9 |
| 10·5 | 11·6 | 16·0 | 11·3 | 7·5 | 1·7 | 1·6 | 2·3 | 1·7 | 1·7 |
| 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 3·8 | 7·3 | 6·6 | 7·6 | 7·1 |
| 7·1 | 6·3 | 9·1 | 7·1 | 5·8 | 0·3 | 0·5 | 0·6 | 0·5 | 0·4 |
| – | – | 5·2 | 6·2 | 5·8 | – | – | 0·3 | 0·5 | 0·4 |
| 88·6 | 77·0 | 75·4 | 72·2 | 75·5 | 3·4 | 5·6 | 5·0 | 5·5 | 5·4 |
| 4·3 | 2·0 | 2·4 | 2·5 | 3·4 | 0·1 | 0·1 | 0·2 | 0·2 | 0·2 |
| – | 14·7 | 7·9 | 12·0 | 9·5 | – | 1·1 | 0·5 | 0·9 | 0·7 |
| – | 100·0 | 100·0 | 100·0 | 100·0 | – | – | 2·0 | 1·8 | 2·0 |
| – | 100·0 | 100·0 | 100·0 | 100·0 | – | – | 2·0 | 1·8 | 2·0 |
| 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 8·2 | 10·7 | 12·0 | 13·9 | 13·2 |
| 70·2 | 53·0 | 47·5 | 36·3 | 37·8 | 5·8 | 5·7 | 5·7 | 5·0 | 5·0 |
| – | 19·4 | 24·2 | 34·4 | 27·6 | – | 2·1 | 3·3 | 4·8 | 3·6 |
| 29·8 | 27·5 | 28·3 | 29·3 | 34·5 | 2·4 | 2·9 | 3·0 | 4·1 | 4·5 |
| 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 0·2 | 0·1 | 0·2 | 0·6 | 1·0 |
| | | | | | 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

ඇත. එහෙත් එම කාණ්ඩයෙහි නිමැවුම් වටිනාකම දළ වශයෙන් සියයට 37 කින් වැඩිවී ඇත. එක් රාජ්‍ය සංස්ථාවක නිමැවුම 1970 දී සියයට 51 කින් ඉහල යැම මෙම කාණ්ඩයේ නිෂ්පාදන ආයතන සංඛ්‍යාව අඩුවීමට හේතු වශයෙන් දැක්විය හැක. පාන වර්ග හා ස්ප්‍රීතු කාණ්ඩයෙහි නිමැවුම් වටිනාකම් සැලකියයුතු අන්දමින් ඉහළ ගොස් ඇති අතර, එයට ප්‍රධාන වශයෙන් හේතුවී ඇත්තේ පාන වර්ග උප කාණ්ඩයෙහි නිමැවුම් වටිනාකම සියයට 23 කින් වැඩිවීමය. ඇඳුම් හා පාවහන් ගණයන්හිද නිෂ්පාදන වටිනාකමෙහි වැඩිවීම් දක්වේ. ඇඳුම් ගණයෙහි නිෂ්පාදන ආයතන සංඛ්‍යාව අඩුවූවද විශාල නිෂ්පාදනායතන කිහිපයක නිමැවුම ඉහළ යැම හේතුකොට ගෙන එම ගණයෙහි නිමැවුම් වටිනාකමද ඉහළ ගොස් ඇත.

රසායන ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් භාණ්ඩ ඇතුළත් ප්‍රධාන ගනයෙහිවූ ඛණිජ තෙල් හා ගල් අඟුරු කාණ්ඩයෙහි නිමැවුම් වටිනාකම රුපියල් දශලක්ෂ 181 කින් වැඩිවී ඇත්තේ ප්‍රථම වරට මෙම සමීක්ෂණයට ඇතුළත් කරන ලද, 1969 අගදී වාණිජ නිෂ්පාදනය ඇරඹූ තෙල් පිරිපහදු කම්හලේ නිමැවුම ඊට එකතුවීමෙනි. සිමෙන්ති, සිමෙන්ති නිෂ්පාදිත හා ඇස්බැස්ටෝස් නිෂ්පාදිත කාණ්ඩයෙහි නිමැවුම් වටිනාකමද ඉහළ යැමට හේතුවී ඇත්තේ ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලයේ නිමැවුම සියයට 16 කින් ඉහළ යාමයි. නිමැවුම් වටිනාකම සියයට 33 කින් වැඩිවූ විදුලි යන්ත්‍ර සූත්‍ර, මෙවලම්, උපකරණ හා සැපයුම්ද සැලකිය යුතු ලෙස නිමැවුම ඉහළ ගොස් ඇති තවත් කර්මාන්ත කාණ්ඩයකි. මෙම කර්මාන්ත කාණ්ඩයෙහි නිමැවුම් වටිනාකම 1967 සිට 1970 දක්වා වූ කාලච්ඡේදය තුළදී සියයට 47 ක සාමාන්‍ය වාර්ෂික වර්ධනයක් දක්වමින් ස්ථාවර ඉහළ නැමියාවක් පෙන්විය. මෙම කර්මාන්ත කාණ්ඩයෙහි නිමැවුම් වටිනාකම මෙසේ වැඩිවූයේ, ග්‍රාමීය පෙදෙස් වෙත විදුලිය සැපයුම හා කෘෂිකාර්මික අංශයේ ආදායම් ඉහළ යැම හේතු කොට ගෙන විදුලිය උපකරණ සහ මෙවලම් වෙතවූ ඉල්ලුම ඉහල යැමය.

නිමැවුම් වටිනාකමෙහි වැඩිවීම අනුව කාර්මික උප ගනයන්ගේ වර්ගීකරණයක් II (ආ) 2 (1) සංඛ්‍යා සටහනේ දක්වෙයි.

**II (ආ) 2 (1) සංඛ්‍යා සටහන**

| රු. 0 – රු. දශලක්ෂ 5 දක්වා | රු. දශලක්ෂ 5 – 20 දක්වා | රු. දශලක්ෂ 20 – 50 දක්වා | රු. දශලක්ෂ 50 ට වැඩි |
|---|---|---|---|
| එළවළු තෙල් සහ මේද<br>කල්තැබිය හැකි ආහාර<br>විස්කෝත්තු සහ රස කැවිලි<br>නූල් කැටීම සහ රෙදි විවීම<br>දැව<br>තුනී ලෑලි<br>කඩදාසි නිෂ්පාදිත<br>කාර්මික රසායනික ද්‍රව්‍ය<br>විවිධ රසායනික ද්‍රව්‍ය<br>රබර් නිෂ්පාදිත<br>ප්ලාස්ටික් නිෂ්පාදිත<br>වීදුරු නිෂ්පාදිත<br>ඉල්මනයිට් | පාන වර්ග සහ ස්ප්‍රීතු<br>ගොතන ලද සහ මැසූ ඇඳුම්<br>පාවහන් හා සම නිෂ්පාදන<br>සිමෙන්ති සහ සිමෙන්ති නිෂ්පාදිත<br>යකඩ සහ වානේ<br>සකස් කළ ලෝහ භාණ්ඩ<br>නිෂ්පාදිත භාණ්ඩ අ. ස. නො. | විවිධ ආහාර නිෂ්පාදිත<br>විදුලිය යන්ත්‍ර සූත්‍ර | ඛනිජ තෙල් හා ගල් අඟුරු නිෂ්පාදිත |

1970 දී උළු හා ගඩොල්, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සහ පිහන් බඩු යන උප කාණ්ඩයන් හැරුණ විට අනෙක් සෑම උප කාණ්ඩයකම නිමැවුම් වටිනාකමේ වැඩිවීමක් සටහන් විය.

එහෙත් 1969 දී රුපියල් දශ ලක්ෂ 5 සිට 20 දක්වා නිමැවුම් වටිනාකමේ වැඩිවීමකින් යුක්ත වූ කර්මාන්ත උප කාණ්ඩයන් තුනක් සහ රුපියල් දශ ලක්ෂ 20 සිට 50 දක්වා නිමැවුම් වටිනාකමේ වැඩිවීමක් දක්වූ උප කාණ්ඩයන් දෙකක් 1970 දී රුපියල් දශ ලක්ෂ 0 සිට 5 දක්වා නිමැවුම වටිනාකම වැඩි වූ ගණයට වැටී ඇත. එසේම, රුපියල් දශ ලක්ෂ 20 සිට 50 දක්වා වැඩී ගිය නිමැවුම් වටිනාකමක් දැක් වූ කර්මාන්ත උප කාණ්ඩයක් 1970 දී රුපියල් දශ ලක්ෂ 5 සිට 20 දක්වා නිමැවුම් වටිනාකම වැඩි වූ ගණයට වැටී ඇත. රුපියල් දශ ලක්ෂ 50 ට වැඩි ගණයට අයත්වනුයේ එකම උප කාණ්ඩයකි; එනම් ඛනිජ තෙල් සහ ගල් අඟුරු නිෂ්පාදිතයන්ය.

නිෂ්පාදන ආයතන සංඛ්‍යාවේ වෙනස්වීම සහ ඒ අනුව සිදුවූ නිමැවුම වටිනාකමෙහි වෙනස් වීම් II (ආ) 2 (2) සංඛ්‍යා සටහනෙහි දක්වේ. පිළිතුරු සැපයූ නිෂ්පාදන ආයතන සංඛ්‍යාවේ (මූලික ලෝහ නිෂ්පාදිත හැර) අඩුවීමක් සිදු වුවද, සැම ප්‍රධාන කර්මාන්ත ගණයකම නිමැවුම් වටිනාකම ඉහළ ගොස් ඇත. වසා දමන ලද නිෂ්පාදන ආයතන ප්‍රධාන වශයෙන් කුඩා ඒවා වූ අතර, එයින් නිමැවුම් වටිනාකම කෙරෙහි කිසිදු බලපෑමක් සිදුවී නොමැත.

## II (ආ) 2 (2) සංඛ්‍යා සටහන

### වාර්තා සැපයූ ආයතන සංඛ්‍යාව සහ නිෂ්පාදන වටිනාකම

| කාර්මික ගණය | | වාර්තා සැපයූ ව්‍යාපාරික ආයතන සංඛ්‍යාවේ වෙනස | නිෂ්පාදන වටිනාකමෙහි වෙනස, (රුපියල් දශලක්ෂ) |
|---|---|---|---|
| I. | ආහාරපාන සහ දුම්කොළ .. | — 5 | + 42·7 |
| II. | රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් කර්මාන්ත .. | — 7 | + 15·6 |
| III. | දැව සහ දැව භාණ්ඩ නිෂ්පාදනය .. | — 4 | + 3·2 |
| IV. | කඩදාසි සහ කඩදාසි භාණ්ඩ නිෂ්පාදනය .. | — 21 | + 2·7 |
| V. | රසායනද්‍රව්‍ය, ඛනිජතෙල්, ගල් අඟුරු සහ ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය | — 32 | +189·4 |
| VI. | ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (ගල් අඟුරු හා ඛනිජ තෙල් හැර) .. | — 8 | + 15·5 |
| VII. | මූලික ලෝහ නිෂ්පාදිත .. | — | + 10·1 |
| VIII. | සකස් කළ ලෝහ භාණ්ඩ, යන්ත්‍රසූත්‍ර හා උපකරණ නිෂ්පාදනය .. | — 54 | + 29·9 |
| IX. | නිෂ්පාදික භාණ්ඩ අ. ස. නො. .. | + 22 | + 9·1 |
| | එකතුව | — 109 | + 318·2 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

### (ඇ) කාර්මික කිරීමේ ව්‍යුහය සහ රටාව

II (ආ) 2 සංඛ්‍යා සටහනෙහි 1966-70 කාලච්ඡේදය සඳහා නිෂ්පාදන වටිනාකම දක්වන දත්තයන් මගින් පෙන්නුම් කෙරෙන පරිදි ආහාර පාන හා දුම්කොළ සහ රෙදි පිළි, ඇඳුම් හා සම් කර්මාන්තය යන ද්වි ගනයන්හි කොටස 1966 දී පිළිවෙලින් සියයට 45·9 සහ සියයට 21·0 සිට 1970 දී පිළිවෙලින් සියයට 35·2 සහ සියයට 14·5 දක්වා ක්‍රමයෙන් අඩු වී ඇත. අනෙක් අතට, රසායනික ද්‍රව්‍ය, ඛනිජතෙල්, ගල්අඟුරු, රබර් හා ප්ලාස්ටික් නිෂ්පාදන සහ සකස් කරන ලද ලෝහ භාණ්ඩ, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ යන ද්වීගනයන්ගේ කොටස් 1966 දී පිළිවෙලින් සියයට 16·1 සහ සියයට 8·2 සිට 1970 දී පිළිවෙලින් සියයට 22·6 සහ සියයට 13·2 දක්වා වැඩි වූ බවද පෙනී යයි.

II (ආ) 2 සංඛ්‍යා සටහනේ දක්වෙන සමහර උප කාණ්ඩයන්හි නිෂ්පාදන වටිනාකම 1970 වර්ෂයේදී සැලකිය යුතු වැඩිවීමකට ලක්විය. පාන වර්ග සහ ස්ප්‍රීතු යන උප කාණ්ඩයේ වැඩිවීමට මුළුමණින්ම හේතු වූයේ පිළිවෙලින් සියයට 38 කින් සහ සියයට 41 කින් නිෂ්පාදනය වැඩි වූ බීර හා ස්ටවුට් සහ සිසිල්බීම නිෂ්පාදනයන්හි ප්‍රසාරනයයි. කල් තැබිය හැකි හා ටින්වල අසුරන ලද නිෂ්පාදන උප ගනයේ වැඩිවීමට බලපෑවේ ආයතන 2 ක ටින්වල

## II (ආ) 3 සංඛ්‍යා සටහන

### 1966—70 කාර්මික නිෂ්පාදනයේ වටිනාකම ප්‍රධාන ආර්ථික ගණ අනුව.

| | රුපියල් දශ ලක්ෂ | | | | | සියයට ගණන | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1966 | 1967 | 1968 | 1969 | 1970 | 1966 | 1967 | 1968 | 1969 | 1970 |
| **අ. පාරිභෝගික භාණ්ඩ** .. | **480·3** | **528·9** | **694·8** | **841·4** | **926·4** | **56·5** | **55·4** | **49·7** | **51·7** | **47·6** |
| I. ආහාරපාන හා දුම්කොළ .. | 144·0 | 185·7 | 238·4 | 287·6 | 346·7 | 16·9 | 19·5 | 17·0 | 17·7 | 17·8 |
| අ. සැකසූ ආහාර(1) .. | 30 9 | 33·7 | 40 8 | 45·8 | 82·9 | 3·6 | 3·5 | 2·9 | 2·8 | 4·3 |
| ආ. කල්තැබිය හැකි සහ ටින්වල අසුරන ලද පලතුරු, එළවළු, මස්, මාළු සහ අනෙකුත් මුහුදු ආහාර(2) .. | 5·1 | 6·7 | 8·4 | 8·6 | 11·8 | 0·6 | 0·7 | 0·6 | 0·5 | 0·6 |
| ඇ. විස්කෝතු සහ රසකැවිලි .. | 38·6 | 33·3 | 44·3 | 49·9 | 50·5 | 4·5 | 3·5 | 3·2 | 3·1 | 2·6 |
| ඈ. සිසිල් බීම .. | 11·6 | 14·5 | 17·3 | 17·9 | 26·6 | 1·4 | 1·5 | 1·2 | 1·1 | 1·4 |
| ඉ. අරක්කු, බීර, ස්ටවුට් යනාදිය(3) .. | 5·5 | 5·5 | 17·1 | 59·5 | 68·3 | 0·6 | 0·6 | 1·2 | 3·7 | 3·5 |
| ඊ. දුම්කොළ .. | 52·3 | 92·0 | 110·5 | 105·9 | 106·6 | 6·2 | 9·7 | 7·9 | 6·5 | 5·5 |
| II. ඇඳුම් පැළඳුම්(4) .. | 56·1 | 48·1 | 55·7 | 56·0 | 64·3 | 6·6 | 5·0 | 4·0 | 3·4 | 3·3 |
| III පාවහන් සහ සම් භාණ්ඩ .. | 27·7 | 31·9 | 32·4 | 38·9 | 45·1 | 3·3 | 3·3 | 2·3 | 2·4 | 2·3 |
| IV. විවිධ රසායනික භාණ්ඩ(5) .. | 101·9 | 98·2 | 118·9 | 155·6 | 155·9 | 12·0 | 10·3 | 8·5 | 9·6 | 8·0 |
| V. කඩදාසි නිෂ්පාදිතයන් සහ කඩදාසි භාණ්ඩ (6) .. | 22·3 | 20·8 | 19·4 | 13·4 | 13·1 | 2·6 | 2·2 | 1·4 | 0·8 | 0·7 |
| VI. සෑදූ ලෝහ භාණ්ඩ යන්ත්‍රෝපකරණ හැර (7) .. | 7·7 | 7·7 | 9·1 | 13·1 | 3·4 | 0·9 | 0·8 | 0·7 | 0·8 | 0·2 |
| VII. ප්ලාස්ටික් භාණ්ඩ .. | 14·5 | 15·9 | 32·5 | 28·2 | 32·8 | 1·7 | 1·8 | 2·3 | 1·7 | 1·7 |
| VIII. වීදුරු සහ වීදුරු භාණ්ඩ . | — | — | 4·8 | 7·7 | 8·1 | — | — | 0·3 | 0·5 | 0·4 |
| IX. පිඟන් බඩු .. | 2·3 | 4·4 | 8·5 | 8·7 | 8·0 | 0·3 | 0·5 | 0·6 | 0·5 | 0·4 |
| X. රබර් භාණ්ඩ (8) .. | 7·0 | 14·0 | 28·2 | 41·3 | 46·7 | 0·8 | 1·4 | 2·0 | 2·5 | 2·4 |
| XI. නූල් කැටීම, රෙදිපිළි වියීම හා නිම කිරීම .. | 95·1 | 97·1 | 136·2 | 172·2 | 173·3 | 11·2 | 10·2 | 9·7 | 10·6 | 8·9 |
| XII දැව නිෂ්පාදන .. | — | 3·6 | 8·0 | 9·2 | 10·4 | — | 0·4 | 0·6 | 0·6 | 0·5 |
| XIII. නිෂ්පාදිත භාණ්ඩ අන් තැනක සඳහන් නොවූ(9) .. | 1·7 | 1·5 | 2·7 | 9·5 | 18·6 | 0·2 | 0·1 | 0·2 | 0·6 | 1·0 |
| **ආ. අන්තර් භාණ්ඩ** | **296·5** | **297·2** | **478·8** | **505·2** | **699·2** | **34·9** | **31·2** | **34·2** | **31·1** | **36·0** |
| I ආහාර නිෂ්පාදිතයන් (10) .. | 245·9 | 236·6 | 371·2 | 354·2 | 337·8 | 28·9 | 24·8 | 26·5 | 21·8 | 17·4 |
| II සෑදූ ලෝහ භාණ්ඩ (යන්ත්‍රෝපකරණ හැර) (11) .. | 8·5 | 8·5 | 8·9 | 10·7 | 11·5 | 1·0 | 0·9 | 0·6 | 0·7 | 0·6 |
| III. කඩදාසි නිෂ්පාදිතයන් සහ කඩදාසි භාණ්ඩ (12) .. | 11·5 | 13·9 | 35·2 | 48·9 | 51·9 | 1·4 | 1·5 | 2·5 | 3·0 | 2·7 |
| IV. කුනී ලෑලි .. | 6·5 | 6·8 | 8·9 | 8·8 | 10·8 | 0·8 | 0·7 | 0·6 | 0·5 | 0·6 |
| V. ඉල්මනයිට් නිෂ්පාදිතයන් .. | 1·4 | 1·4 | 2·2 | 3·1 | 4·7 | 0·2 | 0·1 | 0·2 | 0·2 | 0·2 |
| VI. කාර්මික රසායන (13) .. | 1·9 | 1·9 | 2·3 | 2·2 | 3·1 | 0·2 | 0·2 | 0·2 | 0·1 | 0·2 |
| VII. විදුලි යන්ත්‍ර සූත්‍ර, මෙවලම්, උපකරණ සහ සැපයුම් .. | 20·8 | 28·1 | 41·8 | 66·3 | 88·4 | 2·4 | 3·0 | 3·0 | 4·1 | 4·5 |
| VIII. පෙට්‍රෝලියම් සහ ගල් අඟුරු නිෂ්පාදිතයන් .. | — | — | 8·3 | 11·0 | 191·0 | — | — | 0·6 | 0·7 | 9·8 |
| **ඇ. ආයෝජන භාණ්ඩ** | **73·5** | **128·1** | **225·0** | **280·2** | **319·4** | **8·6** | **13·4** | **16·1** | **17·2** | **16·4** |
| I. සෑදූ ලෝහ භාණ්ඩ (යන්ත්‍රෝපකරණ හැර) (14) .. | 32·8 | 37·9 | 61·5 | 58·2 | 82·0 | 3·8 | 4·0 | 4·4 | 3·5 | 4·2 |
| II. රබර් භාණ්ඩ (15) .. | 11·9 | 6·7 | 13·0 | 11·5 | 9·7 | 1·4 | 0·7 | 0·9 | 0·7 | 0·5 |
| III. සිමෙන්ති, සිමෙන්ති නිෂ්පාදිතයන් සහ ඇස්බැස්ටෝස් නිෂ්පාදිතයන් .. | 28·8 | 53·5 | 70·0 | 89·0 | 104·8 | 3·4 | 5·6 | 5·0 | 5·5 | 5·4 |
| IV. යන්ත්‍ර සූත්‍ර (විදුලි යන්ත්‍ර හැර) සහ ප්‍රවාහණ උපකරණ .. | — | 19·8 | 45·9 | 77·9 | 70·8 | — | 2·0 | 3·3 | 4·8 | 3·6 |
| V. ගඩොල් සහ උළු .. | — | 10·2* | 7·3 | 14·8 | 13·2 | — | 1·1 | 0·5 | 0·9 | 0·7 |
| VI. යකඩ සහ වානේ මූලික කර්මාන්ත (16) . | — | — | 27·3 | 28·8 | 38·9 | — | — | 2·0 | 1·8 | 2·0 |
| එකතුව | 850·3 | 954·2 | 1398·6 | 1626·8 | 1945·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

* වීදුරු නිෂ්පාදිත අඩංගු වේ.

1· කිරි නිෂ්පාදන, අයිස් ක්‍රීම් සහ ලුණු යනාදිය.

2· ජෑම් වර්ග, ජෙලි වර්ග, සෝස් වර්ග, පලතුරු කෝඩියල් යනාදිය.

3· අරක්කු නිෂ්පාදන සංඛ්‍යා 1968, 1969 සහ 1970 වර්ෂ සඳහාය.

4· කමිස, බැනියම් යනාදිය

5· ඖෂධ ද්‍රව්‍ය, අංගරාග සබන් සහ පවිත්‍ර කිරීමේ සංයෝග, ගිනි පෙට්ටි, දන්තාලේප යනාදිය.

6· ලියන කඩදාසි, අභ්‍යාස පොත් යනාදිය.

7· ඇලුමිණියම් භාණ්ඩ.

8· මෝටර් රථ, සහ බයිසිකල් ටයර් සහ ටියුබ, සෙල්ලම් බඩු හා ගෘහෝපකරණ.

9· බුරුසු, ගල්ලෑලි, මුද්‍රණ බ්ලොක්, සෙල්ලම් බඩු හා සංගීත භාණ්ඩ යනාදිය.

10· ගව සහ කුකුල් ආහාර, එළවළු තෙල් වර්ග, අයිස්, කපාපු පොල් යනාදිය.

11· භාජන·

12· මුද්‍රණ කඩදාසි, කාටන්, අනිකුත් ඇසුරුම් පෙට්ටි, සහ ඔතන කඩදාසි.

13· කෝස්ටික් සෝඩා සහ ක්ලෝරින්.

14· කටු කම්බි, කම්බි ඇණ, ගැල්වනයිස් භාණ්ඩ යනාදිය.

15· ටයර් නැවත පිරවීම.

16· රෝල් සහ කම්බි භාණ්ඩ.

## II (ආ) 4 සංඛ්‍යා සටහන

### 1970 නිෂ්පාදන සමාගම් විශාලත්වය අනුව බෙදීගිය අයුරු නිමැවුම් වටිනාකම පදනම් කොට

| කාර්මික ගණය | | නිමැවුම් වටිනාකම | | | |
|---|---|---|---|---|---|
| | | රුපියල් 250 දහසට අඩු | රු. 250 දහසේ සිට රු. ලක්ෂ 2 දක්වා | රු. ලක්ෂ 2 සිට වැඩි | එකතුව |
| I· ආහාර පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදනය | සමාගම් ගණන | 115 | 35 | 24 | 174 |
| | නිමැවුමේ % ගණන | 3·0 | 8·0 | 89·0 | 100·0 |
| II· රෙදි පිළි, ඇඳුම් පැළඳුම් සහ සම්භාණ්ඩ කර්මාන්ත | සමාගම් ගණන | 432 | 76 | 22 | 530 |
| | නිමැවුමේ % ගණන | 8·4 | 19·2 | 72·4 | 100·0 |
| III· දැව සහ දැව භාණ්ඩ (ගෘහ භාණ්ඩ ඇතුළුව) | සමාගම් ගණන | 3 | 6 | 2 | 11 |
| | නිමැවුමේ % ගණන | 1·0 | 23·2 | 75·8 | 100·0 |
| IV· කඩදාසි සහ කඩදාසි භාණ්ඩ නිෂ්පාදන | සමාගම් ගණන | 42 | 26 | 6 | 74 |
| | නිමැවුමේ % ගණන | 6·4 | 33·1 | 60·5 | 100·0 |
| V· රසායන ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන | සමාගම් ගණන | 161 | 56 | 27 | 244 |
| | නිමැවුමේ % ගණන | 2·4 | 8·5 | 89·1 | 100·0 |
| VI· ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිතයන් (පෙට්‍රෝලියම් සහ ගල් අඟුරු හැර) | සමාගම් ගණන | 43 | 15 | 9 | 67 |
| | නිමැවුමේ % ගණන | 2·7 | 7·1 | 90·2 | 100·0 |
| VII· මූලික ලෝහ නිෂ්පාදිතයන් | සමාගම් ගණන | — | — | 1 | 1 |
| | නිමැවුමේ % ගණන | — | — | 100·0 | 100·0 |
| VIII· සකස් කළ ලෝහ භාණ්ඩ, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ නිෂ්පාදිතයන් | සමාගම් ගණන | 124 | 67 | 37 | 228 |
| | නිමැවුමේ % ගණන | 3·7 | 17·8 | 78·5 | 100·0 |
| IX· නිෂ්පාදිත භාණ්ඩ (අන් තැනක සඳහන් නොවන) | සමාගම් ගණන | 38 | 8 | 3 | 49 |
| | නිමැවුමේ % ගණන | 9·7 | 32·9 | 57·4 | 100·0 |
| එකතුව | සමාගම් ගණන | 958 | 289 | 131 | 1,378 |
| | නිමැවුමේ % ගණන | 4·0 | 13·2 | 82·8 | 100·0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

අපුරන ලද නිෂ්පාදිත සහ කල්තැබිය හැකි මස් වර්ගවල නිමැවුම පිළිවෙලින් සියයට 55 කින් සහ සියයට 137 කින් වැඩිවීමයි. කල් තැබිය හැකි මස් නිෂ්පාදනයේ සීඝ්‍ර ප්‍රසාරනයක් ඇති වූයේ ආනයන ආදේශනය සහ මෙම නිෂ්පාදනයන් කෙරෙහි හෝටල් හා සංචාරික කර්මාන්තය තුලින් ඇතිවූ පාරිභෝජික ඉල්ලුම ඉහල යාමේ ප්‍රතිඵලයක් වශයෙනි.

II (ආ) 3 සංඛ්‍යා සටහනේ දක්වා ඇති පරිදි කාර්මික නිෂ්පාදනය ප්‍රධාන ආර්ථික ගන වශයෙන්, එනම් පාරිභෝජික භාණ්ඩ, අන්තර් භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ වශයෙන් වර්ග කිරීමේදී, 1966-70 කාලච්ඡේදය තුලදී පාරිභෝජික භාණ්ඩ ගනය 1966 දී සියයට 56.5 සිට 1970 දී සියයට 47·6 දක්වා අඩු වූ අතර, අන්තර් භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ පිළිවෙළින් 1966 දී සියයට 34·9 සහ සියයට 8·6 සිට 1970 දී පිළිවෙලින් සියයට 36·0 සහ සියයට 16·4 දක්වා වැඩි වී ඇත. 1970 නිමැවුමේ සැලකිය යුතු වැඩිවීමක් වාර්තා කල පාරිභෝජික භාණ්ඩයන්ට කිරි නිෂ්පාදිත, බීර සහ ස්ටවුට්, සිසිල් බීම, කල් තැබිය හැකි මස් සහ කමිස අයත් වූ අතර, අන්තර් භාණ්ඩ ගනයේ කඩදාසි කාටන් හා පෙට්ටි, ඔතන කඩදාසි, විදුලිය යන්ත්‍ර සූත්‍ර හා මෙවලම් සහ ඛනිජ තෙල් හා ගල් අඟුරු නිෂ්පාදිත සිය නිමැවුමේ සැලකිය යුතු වැඩිවීමක් පෙන්නුම් කළේය. ආයෝජන භාණ්ඩ ගනයේ ගැල්වනයිස් නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර (විදුලිය යන්ත්‍ර සූත්‍ර හැර), සිමෙන්ති, සිමෙන්ති නිෂ්පාදිත, ඇස්බැස්ටෝස් නිෂ්පාදිත, රවුම් වානේ සහ කම්බි නිෂ්පාදිතයන්ද නිමැවුමේ වැඩිවීමක් වාර්තා කළේය.

## II (ආ) 4 (1) සංඛ්‍යා සටහන

### හෝරංගත් ව්‍යාපාරයන්හි නිෂ්පාදන වටිනාකම, සේවා නියුක්තිය සහ වැටුප් බිල[1]

| කර්මාන්තය | ව්‍යාපාර සංඛ්‍යාව (1) | සේවා නියුක්තිය (2) | වැටුප් බිල (රුපි. 'දහස්) (3) | නිෂ්පාදන වටිනාකම (රුපි. දහස්) (4) | මුළු නිමැවුමේ ප්‍රතිශතයක් වශයෙන් (5) |
|---|---|---|---|---|---|
| 1. සකස් කළ ආහාර .. | 10 | 5,374 | 13.810 | 150,799 | 60·2 |
| 2. කල් තැබිය හැකි සහ ටින්වල අසුරනලද ආහාර .. | 4 | 422 | 818 | 8,222 | 69·5 |
| 3. විස්කෝතු සහ රසකැවිලි .. | 8 | 1,343 | 2,585 | 41,98⁵ | 83·2 |
| 4. පාන වර්ග .. | 4 | 1,727 | 7,029 | 39,844 | 90·5 |
| 5. දුම්කොළ .. | 5 | 4,320 | 15,763 | 90,334 | 84·7 |
| 6. ඇඳුම් පැළඳුම් .. | 12 | 3,258 | 5,835 | 40,511 | 63·0 |
| 7 නූල් කැටීම සහ රෙදිපිළි විවීම .. | 18 | 11,227 | 23,626 | 130,797 | 75·5 |
| 8. පාවහන් සහ සම් .. | 6 | 2,115 | 6,964 | 37,838 | 83·8 |
| 9. ලෑලි .. | 4 | 1,723 | 4,230 | 8,911 | 85·6 |
| 10. කඩදාසි සහ කඩදාසි නිෂ්පාදිත .. | 13 | 2,373 | 7,470 | 51,482 | 79·2 |
| 11. විවිධ රසායනික ද්‍රව්‍ය .. | 20 | 3,770 | 13,603 | 139,129 | 89·2 |
| 12. ඛනිජ තෙල් සහ ගල් අඟුරු නිෂ්පාදිත .. | 2 | 747 | 4,003 | 190,394 | 99·7 |
| 13. රබර් නිෂ්පාදිත .. | 4 | 3.115 | 11,200 | 48,327 | 85·6 |
| 14. ප්ලාස්ටික් නිෂ්පාදිත .. | 9 | 1,185 | 2,621 | 24,671 | 75·3 |
| 15. වීදුරු සහ වීදුරු නිෂ්පාදිත .. | 2 | 734 | 1,526 | 5,352 | 66·7 |
| 16. සිමෙන්ති සහ ඇස්බැස්ටෝස් .. | 4 | 3,167 | 14,122 | 102,573 | 97·9 |
| 17. ගඩොල් සහ උළු .. | 3 | 1,086 | 2,041 | 7,372 | 56·1 |
| 18. සකස් කළ ලෝහ නිෂ්පාදිත .. | 17 | 3,110 | 6,934 | 62,445 | 64·4 |
| 19. යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ .. | 15 | 2,566 | 7,889 | 56,052 | 79·2 |
| 20. විදුලි යන්ත්‍ර සූත්‍ර .. | 17 | 1,968 | 5,643 | 83,586 | 94·6 |
| 21. නිෂ්පාදිත භාණ්ඩ (අන්තැනක සඳහන් නොවන) .. | 3 | 322 | 545 | 10,681 | 57·5 |
| එකතුව | 180 (9·7*) | 55,652 (52·9*) | 158,257 (69·0*) | 1,331,305 (68·4*) | 68·4 |
| මුළු එකතුව | 1,853 | 105,105 | 229·4 රු. දල | 1,945 0 රු.දල | |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

1 දශ ලක්ෂයකට අධික නිෂ්පාදන වටිනාකම

* මුළු එකතුවෙහි ප්‍රතිශතයක් වශයෙන්.

## II (ආ) 5 සංඛ්‍යා සටහන

### 1970 නිෂ්පාදන සමාගම්, විශාලත්වය අනුව බෙදී ගිය අයුරු-වැටුප් පිරිවැය පදනම් කොට

| කාර්මික ගණය | | රු.පි. 15 දහසට අඩු | රු.පි. 15 දහස — 50 දහසට අඩු | රු.පි. 50 දහස — 500 දහසට අඩු | රු.පි. 500 දහස සහ වැඩි | එකතුව |
|---|---|---|---|---|---|---|
| I. ආහාර පාන සහ දුම්කොළ නිෂ්පාදනය | සමාගම් ගණන | 89 | 37 | 36 | 12 | 174 |
| | වැටුප් වැයේ % ගණන | 1·7 | 3·7 | 17·9 | 76·7 | 100·0 |
| II. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් භාණ්ඩ කර්මාන්ත | සමාගම් ගණන | 343 | 106 | 65 | 16 | 530 |
| | වැටුප් වැයේ % ගණන | 5·2 | 5·9 | 18·6 | 70·3 | 100·0 |
| III. දැව සහ දැව භාණ්ඩ (ගෘහ භාණ්ඩ ඇතුළුව) | සමාගම් ගණන | – | 4 | 4 | 3 | 11 |
| | වැටුප් වැයේ % ගණන | – | 1·1 | 7·9 | 91·0 | 100·0 |
| IV. කඩදාසි සහ කඩදාසි භාණ්ඩ නිෂ්පාදනය | සමාගම් ගණන | 24 | 25 | 22 | 3 | 74 |
| | වැටුප් වැයේ % ගණන | 1·9 | 7·1 | 35·9 | 55·1 | 100·0 |
| V. රසායන ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය | සමාගම් ගණන | 113 | 64 | 50 | 17 | 244 |
| | වැටුප් වැයේ % ගණන | 1·8 | 4·5 | 17·8 | 75·9 | 100· |
| VI. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිතයන් (පෙට්‍රෝලියම් සහ ගල් අඟුරු හැර) | සමාගම් ගණන | 21 | 17 | 22 | 7 | 67 |
| | වැටුප් වැයේ % ගණන | 0·6 | 1·8 | 12·3 | 85·3 | 100·0 |
| VII. මූලික ලෝහ නිෂ්පාදිකයන් | සමාගම් ගණන | – | – | – | 1 | 1 |
| | වැටුප් වැයේ % ගණන | – | – | – | 100·0 | 100·0 |
| VIII. සකස් කළ ලෝහ භාණ්ඩ, යන්ත්‍ර සහ උපකරණ නිෂ්පාදනය | සමාගම් ගණන | 68 | 67 | 78 | 15 | 228 |
| | වැටුප් වැයේ % ගණන | 1·7 | 7·0 | 45·1 | 46·2 | 100·0 |
| IX. නිෂ්පාදිත භාණ්ඩ (අන්තැනක නොසඳහන්) | සමාගම් ගණන | 34 | 4 | 11 | – | 49 |
| | වැටුප් වැයේ % ගණන | 10·5 | 4·7 | 84·8 | – | 100·0 |
| එකතුව | සමාගම් ගණන | 692 | 324 | 288 | 74 | 1378 |
| | වැටුප් වැයේ % ගණන | 2·4 | 4·6 | 22·5 | 70·5 | 100·0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(ඈ) කාර්මික ඒකකයන්හි විශාලත්වය

නිමැවුම් වටිනාකම පදනම් කොට, ව්‍යාපාරයන්ගේ ප්‍රමාණය අනුව විසිරී යෑම පිළිබඳ දත්තයන් අගැයීමේ දී (සංඛ්‍යා සටහන II (ආ) 4) වඩා විශාල ව්‍යාපාරයන් අතර නිෂ්පාදනය ඒකරාශි වීමේ නියත නැමියාවක් පිළිබිඹු වේ. 1970 දී රුපියල් දශ ලක්ෂ 2 ක් සහ ඊට වැඩි නිමැවුමක් ඇති, මුළු සංඛ්‍යාවෙන් සියයට 10 ක්වූ ව්‍යාපාරයන් මුලු නිමැවුමෙන් සියයට 82.8 කට දායක විය. 1966 සිට 1970 දක්වා කාලපරිච්ඡේදය සඳහා වූ දත්තයන්ගෙන් මෙම නැමියාව ඉතා පැහැදිලිව පිළිබිඹු වේ. 1966 රුපියල් දශ ලක්ෂ 2 ක් සහ ඊට වැඩි නිමැවුම් ගනයට අයත් වූ මුළු ආයතන සංඛ්‍යාවෙන් සියයට 6·2 ක් වූ ව්‍යාපාරයන් විසින් මුලු නිමැවුමට වූ දායකත්වය සියයට 63·6 ක් වූ අතර, 1967 සහ 1969 වර්ෂයන් සඳහා තුලනාත්මක සංඛ්‍යා පිළිවෙලින් සියයට 5·5 හා සියයට 66·4 සහ සියයට 8·2 හා සියයට 78·1 වේ. ව්‍යාපාර සංඛ්‍යාවෙන් වැඩි ප්‍රතිශතයක් ඇතුලත්, එහෙත් මුළු නිමැවුමෙන් ඉතා සුලු කොටසක් නිෂ්පාදනය කළ, රුපියල් 250,000 ට අඩු සහ රුපියල් 250,000 සිට රුපියල් දශ ලක්ෂ 2 දක්වා වූ අනෙක් ද්වි ගනයන්හි මීට ප්‍රති විරුද්ධ නැමියාවක් පෙනේ. 1970 දී රුපියල් 250,000 අඩු ගණයෙහිවූ ව්‍යාපාර 958 ක් නිෂ්පාදනය කළේ මුළු නිමැවුමෙන් සියයට 4 ක් පමණි. 1969 දී එය පිළිවෙලින් 1,105 සහ සියයට 5·9 ක් විය. රුපියල් 250,000 සිට රුපියල් දශ ලක්ෂ 2 ක දක්වා වූ ගනයෙහි 1970 දී ව්‍යාපාර 289 ක් නිමැවුමෙන් සියයට 13·2 කට දායක වූ අතර, පසුගිය වර්ෂය සඳහා සංසන්දනාත්මක සංඛ්‍යා වනුයේ පිළිවෙලින් 306 සහ සියයට 16·0 යි. සංඛ්‍යා සටහනින් පෙනී යන අයුරු, ව්‍යාපාර කිහිපයක් තුළ වූ නිමැවුමේ ඒකාග්‍රතාවයේ විස්තාරය විවිධ කාර්මික ගනයන්හි වෙනස්ව පවතී.

විස්කෝත්තු සහ රස කැවිලි ගනයෙහි මුළු නිමැවුමෙන් සියයට 83·2 ක් ව්‍යාපාර 8 ක් විසින් නිෂ්පාදනය කළ අතර, බීම වර්ග ගනයෙහි ව්‍යාපාර 4 ක් සහ දුම්කොළ ගනයෙහි ව්‍යාපාර 5 ක් පිළිවෙලින් නිමැවුමෙන් සියයට 90·5 ක් සහ සියයට 84·7 කට දායක වූහ. පාවහන්, සිමෙන්ති සහ ඇස්බැස්ටෝස් නිෂ්පාදිතයන්හි විශාල ව්‍යාපාරයන් වෙළඳපොලෙහි ප්‍රධාන ස්ථානයන් දරූ තවත් කාර්මික ගන දෙකකි.

වැටුප් බිල මත පදනම් වූ ව්‍යාපාරයන්ගේ ප්‍රමාණානුකූල විසිර් යෑම පිළිබඳ II(ආ) 5 සංඛ්‍යා සටහනේ දක්වා ඇති දත්තයන් මගින්ද නිමැවුම ව්‍යාපාර කීපයක ඒකාග්‍රවීම කෙරේ ඍජු සම්බන්ධතාවයක් දක්වා ඇති බැව් පෙනේ. රුපියල් ලක්ෂ 5 කට හා ඊට වැඩි වැටුප් ප්‍රමාණයක් ඇති ගනයෙහි මුළු ව්‍යාපාර සංඛ්‍යාව වූ 1378 න්, 74 ක් 1970 දී මුළු වැටුප් බිලෙන් සියයට 70·5 කට වගකිවූ අතර, රුපියල් 15,000 අඩු ගනයෙහි මුළු සංඛ්‍යාව වූ ව්‍යාපර 1378 න් 692 ක් දායක වූයේ මුළු වැටුප් බිලෙන් සියයට 2·4 කට පමණි.

II (ආ) 4 (1) සංඛ්‍යා සටහනෙහි දක්වා ඇති නිමැවුම් වටිනාකම රුපියල් දශ ලක්ෂයකට අධික වන ව්‍යාපාර 180 ක නිෂ්පාදනය, සේවා නියුක්තිය සහ වැටුප් පිළිබඳ දත්තයන්ගෙන් වඩා විශාල කාර්මික ඒකක ඒකාබද්ධ වීමට ඇති නැමියාව වැඩි දුරටත් පිළිබිඹු වේ.

වාර්තා සැපයූ මුළු ව්‍යාපාර සංඛ්‍යාවෙන් 180 ක් නොහොත් සියයට 9·7 ක් මුළු වැටුප් බිලෙන් සියයට 69·0 ක් සහ මුළු නිමැවුම් වටිනාකමින් සියයට 68·4 කට හේතුවීම වැදගත් කරුණකි.

(ඉ) සේවා නියුක්තිය සහ වැටුප්

1970 වර්ෂය තුළදී වාර්තා සැපයූ ව්‍යාපාර සංඛ්‍යාව 109 කින් අඩු වූ නමුත්, සේවක සංඛ්‍යාවේ හා සේවකයකුගේ මිනිස් දින ගණනෙහි වැඩිවීමෙන් පිළිබිඹු වන පරිදි, සේවා නියුක්තියේ ප්‍රසාරණයක් ඇති විය. 1969 සිට 1970 දක්වා කාලය තුළ සේවක සංඛ්‍යාව 103,726 සිට 105, 105 දක්වා වැඩි වූ අතර, සේවකයකුගේ මිනිස් දින ගණන 273 සිට 276 දක්වා වැඩිවිය. සේවක සංඛ්‍යාවේ සැලකිය යුතු වැඩිවීමක් සමගම නිෂ්පාදන වටිනාකමේ

වැඩිවීමක් ද පෙන් වූ ගනයන්ට ප්‍රධාන වශයෙන් ශ්‍රම සූක්ෂම වූ ආහාර පාන, දුම්කොළ, රෙදි පිළි, ඇඳුම්, සම් නිෂ්පාදන හා ප්‍රථම වරට ඛනිජ තෙල් පිරිපහදුව පිළිබඳ දත්තයන් අඩංගු වූ රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල් අඟුරු, රබර් හා ප්ලාස්ටික් නිෂ්පාදන යන් ඇතුළත් විය. අනික් අතට, සකස් කළ ලෝහ නිෂ්පාදන ගනයේ ව්‍යාපාරවල සේවක සංඛ්‍යාවේ අඩුවීම නිෂ්පාදන වටිනාකම කෙරේ බලපෑමක් ඇතිකරනු වෙනුවට රුපියල් දශ ලක්ෂ 29 කින් නිෂ්පාදන වටිනාකමෙ වැඩිවීමක් පෙන්නුම් කළේය. මෙයට මූලික හේතුව වූයේ මෙම ගනයේ කර්මාන්ත ශ්‍රම සූක්ෂම නොවීමය.

කාර්මික අංශයේ සේවකයන්ගෙන් සියයට 75 ක් පමණ පුරුෂයන් වන අතර, මුළු සේවක සංඛ්‍යාවෙන් සියයට 80 ක් ස්ථිර හා සියයට 20 ක් පමණ තාවකාලික සේවකයන් වූහ.

වාර්තා සැපයූ ව්‍යාපාරයන්හි මුළු වැටුප් බිල 1969 දී රුපියල් දශ ලක්ෂ 199·5 සිට 1970 දී රුපියල් දශ ලක්ෂ 229·4 දක්වා වැඩි විය. ආහාර පාන හා දුම්කොළ ගනයෙහි සියයට 10 කද, රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල් අඟුරු, රබර් හා ප්ලාස්ටික් නිෂ්පාදනයෙහි සියයට 15 කද තරමක වැඩිවීම් වූ අතර, ඛනිජ තෙල්, ගල් අඟුරු හැර අනිකුත් ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත සහ රෙදි පිළි, ඇඳුම් හා සම් කර්මාන්තයෙහි පිළිවෙලින් සියයට 40 ක හා සියයට 45 ක වැඩිවීම් දක්නට ලැබුණි.

වැඩිම වැටුප් බිලක් සහිත ආහාරපාන හා දුම්කොළ ගනයේ සේවකයන් 33,734 ක් (මුළු සේවක සංඛ්‍යාවෙන් සියයට 32 ක් සහ මුළු නිමැවුමෙන් සියයට 35 ද සපයන) මුළු වැටුප් ප්‍රමාණයෙන් සියයට 28 ක් හෝ රුපියල් දශලක්ෂ 64·4 ක් ලදහ. ඊළඟට වැඩිවූ වැටුප් බිලක් දරන ලද්දේ මුළු වැටුප් බිලෙන් සියයට 20 ක් අයත්වූ රුපියල් දශ ලක්ෂ 46·0 ක වැටුප් බිලකින් යුතු රෙදිපිළි ඇඳුම්, සම් කර්මාන්තයන් විසිනි. මෙම වැටුප්, මුළු සේවක සංඛ්‍යාවෙන් සියයට 26 ක්, එනම් සේවකයන් 27,069 ක් විසින් ලබා ගන්නා ලදී. ඉහත සඳහන් කළ ද්වි ගනයන් මුළු වැටුපෙන්, සේවා නියුක්තියෙන් සහ මුළු නිෂ්පාදනයෙන් පිළිවෙලින් සියයට 48, සියයට 58, සහ සියයට 50කට වගකියයි.

1970 වර්ෂය තුල ශ්‍රමික දිනකට ලැබුණ වැටුපත්, සේවකයෙකුගේ ශ්‍රමික දින ගණනත් වැඩි විය. ආහාර පාන සහ දුම්කොළ, රෙදිපිළි, ඇඳුම් හා හම් කර්මාන්ත සහ වෙන ගනයක් යටතේ දක්වා නොමැති නිෂ්පාදිත භාණ්ඩයන් ද මිනිස් දිනකට අඩුම වේතනයන් ගෙවන ගනයන් 3 කි. මෙසේ වීමට හේතුව මෙම ගනයන්හි ස්ත්‍රීන් සහ තාවකාලික සේවකයන්ගේ සියයට ගණන, පුරුෂයන් හෝ ස්ථිර සේවකයන්ගේ ගණනට වඩා වැඩි වීමය.

**(ඊ) අමු ද්‍රව්‍ය උපයෝගී කර ගැනීම**

දේශීය කර්මාන්තයන්හි අමු ද්‍රව්‍යයන් උපයෝගී කර ගැනීම පිළිබඳ II (ආ) 6 සංඛ්‍යා සටහනෙහි අඩංගු දත්තයන් විශ්ලේෂණය කිරීමේදී අධෛර්යමත් වන සාධක කිහිපයක් හෙළිවේ. කර්මාන්තයන් සඳහා අවශ්‍ය අමුද්‍රව්‍යයන්ගෙන් හතරෙන් තුනක් පමණවූ ප්‍රමාණයක් විදේශීය මූලයන්ගෙන් ලැබී ඇති අතර, අමු ද්‍රව්‍ය පාවිච්චි කිරීමේ රටාව 1966–70 කාලය තුළ දී බොහෝ දුරට නොවෙනස්ව පැවතුනි. විදේශීය අමු ද්‍රව්‍ය වැඩි වශයෙන් උපයෝගී කර ගැනීමේ නියත නැමියාවක් පැවති සකස් කළ ලෝහ භාණ්ඩ, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සහ රසායන ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල් අඟුරු, රබර් හා ප්ලාස්ටික් නිෂ්පාදිත ගණයන්ගේ තත්ත්වය මෙයටත් වඩා අසතුටුදායක විය. එහෙත් කඩදසි, කඩදසි භාණ්ඩ සහ ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (ඛනිජ තෙල් සහ ගල් අඟුරු හැර) යන ගන කිහිපයක විදේශීය යෙදවුම් සඳහා ක්‍රමයෙන් වැඩිවන දේශීය අමු ද්‍රව්‍ය ආදේශනයක් දක්නට ඇත. ආහාරපාන හා දුම්කොළ යන ගනයෙහි විදේශීය අමු ද්‍රව්‍ය අනුපාතයෙහි තරමක වැඩිවීමක් සිදු වී ඇත. සියයට 62·4 ක් වන විදේශීය අමු ද්‍රව්‍යයන්ගේ වැඩි වූ පාවිච්චියට හේතු වූයේ ආහාර පාන ගනයෙහි සියයට වැඩි ප්‍රමාණයක් විදේශීය අමු ද්‍රව්‍ය පාවිච්චි කරන විශාල ඒකක හතරක ඇති වූ නිෂ්පාදිතයෙහි සැළකිය යුතු වැඩිවීමයි.

## II (අං) 6 සංඛ්‍යා සටහන

## නිෂ්පාදනය සහ අමු ද්‍රව්‍ය — 1970

රුපියල් දහස් ගණනින්

| කාර්මික ගණය | ව්‍යාපාරික ආයතන | නිෂ්පාදනය | අමු ද්‍රව්‍ය | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | දේශීය | | විදේශීය | | එකතුව | |
| | | රු. දශලක්ෂ | වටිනාකම | සියයට ගණන | වටිනාකම | සියයට ගණන | වටිනාකම | සියයට ගණන |
| I. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදනය .. | 147 | 214·0 | 46,710 | 37·6 | 77,646 | 62·4 | 124,356 | 100·0 |
| II. රෙදිපිළි, ඇඳුම් පැලඳුම් සහ සම්භාණ්ඩ කර්මාන්තය .. | 507 | 233·4 | 29,487 | 26·9 | 80,009 | 73·1 | 109,496 | 100·0 |
| III. දැව සහ දැව භාණ්ඩ (ගෘහ භාණ්ඩ ඇතුළුව) .. | 11 | 21·2 | 8,118 | 82·3 | 1,746 | 17·7 | 9,864 | 100·0 |
| IV. කඩදාසි සහ කඩදාසි භාණ්ඩ නිෂ්පාදන .. .. | 68 | 61·0 | 15,049 | 44·2 | 19,025 | 55·8 | 34,074 | 100·0 |
| V. රසායන ද්‍රව්‍ය, ඛනිජ තෙල්, පෙට්‍රෝලියම්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය .. | 214 | 381·7 | 35,109 | 15·2 | 195,286 | 84·8 | 230,395 | 100·0 |
| VI. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිතයන් (පෙට්‍රෝලියම් සහ ගල් අඟුරු හැර) .. | 61 | 133·7 | 22,675 | 55·4 | 18,239 | 44·6 | 40,914 | 100·0 |
| VII. මූලික ලෝහ නිෂ්පාදිතයන් .. .. | 1 | 38·9 | — | — | 24,022 | 100·0 | 24,022 | 100·0 |
| VIII. සකස් කළ ලෝහ භාණ්ඩ, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ නිෂ්පාදනය .. .. | 211 | 239·8 | 25,964 | 17·2 | 124,651 | 82·8 | 150,615 | 100·0 |
| IX. නිෂ්පාදිත භාණ්ඩ (අන් තැනක නොසඳහන්) .. | 31 | 13·9 | 1,525 | 21·8 | 5,486 | 78·2 | 7,011 | 100·0 |
| එකතුව .. | 1,251 | 1,337·6 | 184,637 | 25·3 | 546,110 | 74·7 | 730,747 | 100·0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

කර්මාන්තයන්හි පාවිච්චි කළ අමු ද්‍රව්‍යවල වටිනාකම නිෂ්පාදන වටිනාකමෙන් සියයට 50 ක් පමණ වන බැවින්, දේශීය අමු ද්‍රව්‍ය දියුණු කිරීමට හැකි සෑම පියවරක්ම ගැනීම අතිශයින් වැදගත්ය. මේ සම්බන්ධයෙන් අමු ද්‍රව්‍ය සකස් කිරීම පිළිබඳව පෞද්ගලික අංශයෙන් පටන් ගැන්මක් ඇතිවේ යයි සිතිය නොහැක. සිදු වූවත් එය ඉතා හෙමින් සිදුවන්නකි. ලංකාවේ වර්තමාන විදේශ විනිමය ප්‍රශ්නය අනුව බලන විට මෙම කාර්යය සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග රජය විසින් ගතයුතුව ඇත.

## (උ) බලය සහ ඉන්ධන

II (ආ) 7 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇති කර්මාන්තයන්හි බලය සහ ඉන්ධන පාවිච්චිය පිළිබඳ සංඛ්‍යා ලේඛනවලින් පෙනී යන්නේ ඒ සඳහා යන වියදමෙන් සියයට 50 ක් පමණ පැට්‍රෝල් සහ තෙල් සඳහා ද විදුලිය සඳහා සියයට 41·6 ක්ද, ගල් අඟුරු සහ ගෑස් සඳහා සියයට 3·2 ක් ද වන බවත්ය. පසුගිය වර්ෂයේ බලය සහ ඉන්ධන සඳහා කළ මුළු වියදමෙන් සියයට 41·2 ක් පැට්‍රෝල් සහ තෙල් සඳහාද, සියයට 49·1 ක් විදුලි බලය සඳහාද, සියයට 3·5 ක් ගල් අඟුරු සහ ගෑස් සඳහාද විය.

### II (ආ) 7 සංඛ්‍යා සටහන

### නිෂ්පාදනය සහ ඉන්ධන — 1970

| කාර්මික ගණය | සමාගම් ගණන | නිෂ්පාදනය (රුපියල් දශලක්ෂ) | පාවිච්චි කළ ඉන්ධන (රුපියල් දහස් ගණනින්) | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | විදුලි බලය | ගල් අඟුරු සහ ගෑස් | පැට්‍රෝල් සහ තෙල් | අනෙකුත් | එකතුව |
| I. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදනය .. | 102 | 211·0 | 3,137 | 293 | 1,528 | 73 | 5,031 |
| II. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම්භාණ්ඩ කර්මාන්තය .. | 174 | 203·5 | 2,116 | 62 | 1,390 | 3 | 3,571 |
| III. දැව සහ දැව භාණ්ඩ (ගෘහ භාණ්ඩ ඇතුළුව) .. | 6 | 19·8 | 165 | 38 | 119 | – | 322 |
| IV කඩදාසි සහ කඩදාසි භාණ්ඩ නිෂ්පාදනය .. | 42 | 50·5 | 1,324 | 8 | 32 | – | 1,364 |
| V. රසායන ද්‍රව්‍ය, පෙට්‍රෝලියම්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය · | 119 | 359·7 | 2,364 | 72 | 8,345 | 599 | 11,380 |
| VI. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිතයන් (පෙට්‍රෝලියම් සහ ගල් අඟුරු හැර) .. | 32 | 128·9 | 5,512 | 9 | 9,484 | 69 | 15,074 |
| VII. මූලික ලෝහ නිෂ්පාදිතයන් .. | 1 | 38·9 | 1,412 | – | 664 | – | 2,076 |
| VIII. සකස් කළ ලෝහ භාණ්ඩ, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ නිෂ්පාදනය .. | 123 | 151·3 | 1,016 | 815 | 373 | 31 | 2,235 |
| IX. නිෂ්පාදිත භාණ්ඩ (අන් තැනක සඳහන් නොවන) | 23 | 13·7 | 99 | 8 | 17 | – | 124 |
| එකතුව .. | 622 | 1,177·3 | 17,145 | 1,305 | 21,952 | 775 | 41,717 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## පළාත් අනුව කර්මාන්ත

| කාර්මික ගණය | බස්නාහිර පළාත | | උතුරු පළාත | |
|---|---|---|---|---|
| | ආයතන සංඛ්‍යාව | ප්‍රතිශතය | ආයතන සංඛ්‍යාව | ප්‍රතිශතය |
| **1· ආහාර පාන සහ දුම්කොළ නිෂ්පාදනය** | **159** | **72·9** | **10** | **4·6** |
| (අ) සකස් කළ ආහාර | 44 | 74·6 | 7 | 11·9 |
| (ආ) එළවළු තෙල් සහ මේද | 25 | 86·2 | — | — |
| (ඇ) කල් තැබිය හැකි සහ ටින්වල අසුරන ලද පළතුරු, එළවළු, මස්, මාළු සහ අනෙකුත් මුහුදු ආහාර | 31 | 75·6 | — | — |
| (ඈ) විස්කෝතු, කොකෝවා, චොකලට් සහ සීනි රස කැවිලි | 45 | 66·2 | 2 | 2·9 |
| (ඉ) බීම වර්ග | 14 | 66·7 | 1 | 4·8 |
| (ඊ) දුම්කොළ | | ලැ | | බී |
| **2. රෙදිපිළි, ඇඳුම් සහ සම් කර්මාන්ත** | **353** | **80·0** | **12** | **2·7** |
| (අ) ගොතන ලද සහ මැසූ ඇඳුම් පැළඳුම් (පාවහන් හැර) | 215 | 81·7 | 4 | 1·5 |
| (ආ) නූල් කැටීම, රෙදි වියීම සහ නිම කිරීම | 81 | 74·3 | 7 | 6·4 |
| (ඇ) පාවහන් සහ සම් නිෂ්පාදිත | 57 | 82·6 | 1 | 1·4 |
| **3· දැව සහ දැව නිෂ්පාදිත (ගෘහභාණ්ඩ ඇතුළුව)** | **12** | **80·0** | — | — |
| (අ) දැව නිෂ්පාදනය | 12 | 85·7 | — | — |
| (ආ) තුනී ලෑලි | — | — | — | — |
| **4· කඩදාසි සහ කඩදාසි භාණ්ඩ නිෂ්පාදනය** | **86** | **89·6** | **4** | **4·2** |
| **5· රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය** | **220** | **85·6** | **7** | **2·7** |
| (අ) කාර්මික රසායනික ද්‍රව්‍ය | — | — | 1 | 100·0 |
| (ආ) විවිධ රසායනික ද්‍රව්‍ය | 119 | 84·4 | 3 | 2·1 |
| (ඇ) ඛනිජ තෙල් සහ ගල් අඟුරු නිෂ්පාදිත | 4 | 100·0 | — | — |
| (ඈ) රබර් නිෂ්පාදිත | 14 | 73·7 | 1 | 5·3 |
| (ඉ) ප්ලාස්ටික් නිෂ්පාදිත | 83 | 90·2 | 2 | 2·2 |
| **6· ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (ඛනිජ තෙල් සහ ගල් අඟුරු හැර)** | **53** | **69·7** | **1** | **1·3** |
| (අ) පිඟන් බඩු | 1 | 50·0 | — | — |
| (ආ) වීදුරු සහ වීදුරු නිෂ්පාදිත | 17 | 85·0 | — | — |
| (ඇ) සිමෙන්ති, සිමෙන්ති නිෂ්පාදිත සහ ඇස්බැස්ටෝස් නිෂ්පාදිත | 16 | 84·2 | 1 | 5·3 |
| (ඈ) ඉල්මනයිට් නිෂ්පාදනය | — | — | — | — |
| (ඉ) ගඩොල් සහ උළු | 19 | 55·9 | — | — |
| **7· මූලික ලෝහ නිෂ්පාදිත** | **1** | **100·0** | — | — |
| (අ) යකඩ සහ වානේ මූලික කර්මාන්ත | 1 | 100·0 | — | — |
| **8· සකස් කළ ලෝහ භාණ්ඩ, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ** | **245** | **86·9** | **11** | **3·9** |
| (අ) යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ හැර සකස් කළ ලෝහ භාණ්ඩ | 137 | 84·0 | 8 | 4·9 |
| (ආ) යන්ත්‍ර සූත්‍ර (විදුලිය යන්ත්‍ර සූත්‍ර හැර) සහ ප්‍රවාහන උපකරණ | 61 | 87·1 | 3 | 4·3 |
| (ඇ) විදුලිය යන්ත්‍ර සූත්‍ර, මෙවලම්, උපකරණ සහ සැපයුම් | 47 | 95·9 | — | — |
| **9· නිෂ්පාදිත භාණ්ඩ අ· ස· නො·** | **19** | **73·1** | **1** | **3·8** |
| එකතුව | 1148 | 81·3 | 46 | 3·3 |

## සන්ගි පිහිටීම

| දකුණු පළාත | | නැගෙනහිර පළාත | | මධ්‍යම පළාත | | වයඹ පළාත | | උතුරු මැද පළාත | | සබරගමු පළාත | | ඌව පළාත | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ආයතන සංඛ්‍යාව | ප්‍රතිශතය | ආයතන සංඛ්‍යාව | ප්‍රතිශතය | ආයතන සංඛ්‍යාව | ප්‍රතිශතය | ආයතන සංඛ්‍යාව | ප්‍රතිශතය | ආයතන සංඛ්‍යාව | ප්‍රතිශතය | ආයතන සංඛ්‍යාව | ප්‍රතිශතය | ආයතන සංඛ්‍යාව | ප්‍රතිශතය | ආයතන සංඛ්‍යාව | ප්‍රතිශතය |
| **12** | **5·5** | **6** | **2·8** | **16** | **7·3** | **5** | **2·3** | **1** | **0·5** | — | — | **9** | **4·1** | **218** | **100·0** |
| 4 | 6·8 | — | — | 2 | 3·4 | — | — | — | — | — | — | 2 | 3·4 | 59 | 100·0 |
| 1 | 3·4 | — | — | — | — | 3 | 10·4 | — | — | — | — | — | — | 29 | 100·0 |
| 1 | 2·4 | — | — | 3 | 7·3 | — | — | — | — | — | — | 6 | 14·6 | 41 | 100·0 |
| 4 | 5·9 | 4 | 5·9 | 10 | 14·7 | 1 | 1·5 | 1 | 1·5 | — | — | 1 | 1·5 | 68 | 100·0 |
| 2 | 9·5 | 2 | 9·5 | 1 | 4·8 | 1 | 4·8 | — | — | — | — | — | — | 21 | 100·0 |
| | තො | | මැ | | ත | | | | | | | | | | |
| **31** | **7·0** | **3** | **0·7** | **23** | **5·2** | **12** | **2·7** | **1** | **0·2** | **1** | **0·2** | **5** | **1·2** | **441** | **100·0** |
| 21 | 8·0 | 1 | 0·4 | 16 | 6·1 | 3 | 1·1 | — | — | 1 | 0·4 | 2 | 0·8 | 263 | 100·0 |
| 6 | 5·5 | 1 | 0·9 | 3 | 2·8 | 8 | 7·3 | 1 | 0·9 | — | — | 2 | 1·8 | 109 | 100·0 |
| 4 | 5·8 | 1 | 1·4 | 4 | 5·8 | 1 | 1·4 | — | — | — | — | 1 | 1·4 | 69 | 100·0 |
| **2** | **13·3** | — | — | — | — | — | — | — | — | **1** | **6·7** | — | — | **15** | **100·0** |
| 1 | 7·1 | — | — | — | — | — | — | — | — | 1 | 7·1 | — | — | 14 | 100·0 |
| 1 | 100·0 | — | — | — | — | — | — | — | — | — | — | — | — | 1 | 100·0 |
| **4** | **4·2** | **1** | **1·0** | **1** | **1·0** | — | — | — | — | — | — | — | — | **96** | **100·0** |
| **11** | **4·3** | **1** | **0·4** | **15** | **5·8** | **1** | **0·4** | — | — | — | — | **2** | **0·8** | **257** | **100·0** |
| — | — | — | — | — | — | — | — | — | — | — | — | — | — | 1 | 100·0 |
| 5 | 3·5 | 1 | 0·7 | 12 | 8·5 | — | — | — | — | — | — | 1 | 0·7 | 141 | 100·0 |
| — | — | — | — | — | — | — | — | — | — | — | — | — | — | 4 | 100·0 |
| 1 | 5·3 | — | — | 1 | 5·3 | 1 | 5·3 | — | — | — | — | 1 | 5·3 | 19 | 100·0 |
| 5 | 5·4 | — | — | 2 | 2·2 | — | — | — | — | — | — | — | — | 92 | 100·0 |
| **2** | **2·6** | **3** | **3·9** | **2** | **2·6** | **15** | **19·7** | — | — | — | — | — | — | **76** | **100·0** |
| — | — | — | — | — | — | 1 | 50·0 | — | — | — | — | — | — | 2 | 100·0 |
| 1 | 5·0 | 1 | 5·0 | — | — | 1 | 5·0 | — | — | — | — | — | — | 20 | 100·0 |
| — | — | — | — | 2 | 10·5 | — | — | — | — | — | — | — | — | 19 | 100·0 |
| — | — | 1 | 100·0 | — | — | — | — | — | — | — | — | — | — | 1 | 100·0 |
| 1 | 2·9 | 1 | 2·9 | — | — | 13 | 38·2 | — | — | — | — | — | — | 34 | 100·0 |
| — | — | — | — | — | — | — | — | — | — | — | — | — | — | **1** | **100·0** |
| — | — | — | — | — | — | — | — | — | — | — | — | — | — | 1 | 100·0 |
| **9** | **3·2** | **2** | **0·7** | **8** | **2·8** | **6** | **2·1** | — | — | **1** | **0·4** | — | — | **282** | **100·0** |
| 4 | 2·5 | 1 | 0·6 | 7 | 4·3 | 5 | 3·1 | — | — | 1 | 0·6 | — | — | 163 | 100·0 |
| 4 | 5·7 | 1 | 1·4 | — | — | 1 | 1·4 | — | — | — | — | — | — | 70 | 100·0 |
| 1 | 2·0 | — | — | 1 | 2·0 | — | — | — | — | — | — | — | — | 49 | 100·0 |
| **2** | **7·7** | — | — | **4** | **15·4** | — | — | — | — | — | — | — | — | **26** | **100·0** |
| 73 | 5·2 | 16 | 1·1 | 69 | 4·9 | 39 | 2·8 | 2 | 0·1 | 3 | 0·2 | 16 | 1·1 | 1,412 | 100·0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව